

## 1.8. ශ්‍රී ලාංකීය කිතුනු ඇදහිල්ල





මේ පුද්ගලයෝ හඳුනා ගනිමු.

| | |
|---|---|
| *ජුසේවාස් පියතුමා | *ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා |
| *මර්සිලින් ජයකොඩි පියතුමා | *මහත්මා ගාන්ධි තුමා |
| *සාන්ත සිසිලියා තුමිය | *ආතර් සී. ක්ලාක් මහතා |

- මේ අයගෙන් ශ්‍රී ලාංකිකයෝ කවුරු ද?
- ශ්‍රී ලාංකීය ක්‍රිස්තියානීන් වෙනුවෙන් සේවය කළෝ කවුරු ද?
- මේ අයගේ ජීවත් වීමේ අරමුණු මොනවා ද?

ක්‍රි.ව. 1505 නොවැම්බර් 15 වැනි දින වෙළෙඳාම සඳහා පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණි නමුත්, මෙරට සුබාරංචිය ව්‍යාප්ත කළේ පසු ව පැමිණි ධර්මදූතවරු ය.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**පෘතුගීසි ධර්මදූත සේවය මෙරට සාර්ථක වීමට බලපෑ හේතු:**

- පෘතුගීසි ධර්මදූතවරුන් ලාංකීය ජන ජීවිතයට ඉතා සමීප පිරිසක් වීම.
- දේශීය භාෂා ඉගෙන ගෙන ධර්මය ප්‍රචාරය කිරීම.
- ධීවර ජනාවාස ප්‍රදේශවලින් ධර්ම ප්‍රචාරක කටයුතු ඇරඹීම.
- සියලු ම ජන කොටස්වලට එක හා සමාන ලෙස සැලකීම.
- සරල අල්පේච්ඡ ජීවිතය.

ක්‍රි.ව. 1638 දී ලන්දේසීහු ලංකාවේ මඩකලපුව අල්ලා ගෙන පසුව පෘතුගීසීන් ලංකාවෙන් නෙරපා දැමූහ. ඉන්පසුව ලන්දේසින් විසින් කතෝලිකයින්ට පීඩා කරන ලදි.

**ලන්දේසීන් විසින් කතෝලිකයන්ට ඇති කළ පීඩන ප්‍රතිපත්ති:**

- කතෝලික පූජකවරුන් රහසින් සැඟවී සිට හමු වුවහොත් මරණ දණ්ඩනය නියම කිරීම.
- සියලු ම කතෝලික ධර්මදූතවරුන් පිටුවහල් කිරීම.
- කතෝලික සභාව සතු දේපොල රාජ්‍ය සන්තක කිරීම.
- ලන්දේසි පාසල්වල රෝමානු කතෝලික ධර්මය ඉගැන්වීම් තහනම් කිරීම ඒ වෙනුවට සියලු ම දරුවන්ට ඕලන්ද රෙප්‍රමාදු ධර්මය ඉගැන්වීම.
- රෙප්‍රමාදු දෙව්මැදුරුවල බව්තිස්මය නොලැබූ අයගේ උපත් ලියාපදිංචි නොකිරීම.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ශ්‍රී ලංකාවේ නිවී යමින් තිබුණු දහම් පහන දල්වන්නට දෙවියන් වහන්සේ විසින් තෝරාගනු ලැබුවේ ඔරතෝරියානු නිකායයි. ඉන්දියාවේ උපත ලබා පසු කලෙක ලංකාවේ අපෝස්තුලුවරයා ලෙස හඳුන්වනු ලැබූ ජුසේවාස් පියතුමා මේ වගකීම භාර ගත්තේ ය. ඉතා දුෂ්කරතා මැදින් ගමන ඇරඹූ මෙතුමාට 1696 දී ජෝශප් මෙනසස් හා ජෝශප් රවැල්ලෝ යන පූජක දෙනම කැඳවා ගැනීමට හැකි විය. පසුව කතෝලික සාහිත්‍යයේ පියා ලෙස හැඳින්වූ ජාකෝමේ ගොන්සාල්වෙස්, මනුවෙල් ද මිරැන්ඩා, මිගෙල් ද මෙල්ලෝ නමැති ඔරතෝරියානු පියවරු එක්වූහ.


ලංකාවේ පසුබිම අනුව මේ අය කතෝලික ආගම දේශානුරූපීකරණය කිරීමට බොහෝ සෙයින් මහන්සි ගත්හ. ලංකාවේ සංස්කෘතිය අනුව ආගම පැතිරවීමට උත්සාහ ගත් නිසා කිතුනු අපගේ විශ්වාසය ශක්තිමත් විය. මොවුහු ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් තම ජීවිත කැප කළහ.

ක්‍රි.ව. 1544 දී මන්නාරමේ දී ප්‍රාණ පරිත්‍යාගවරුන් ලෙස 600කට ආසන්න පිරිසක් ජීවිත පූජා කළහ. ඔවුන්ගේ රුධිරය අපගේ විශ්වාසයේ බීජ බවට පත්විය. ලංකාවේ සිටි ධර්මදූතවරු කැපවීමෙන් වැඩ කළහ.

විශ්වාසයේ ධර්මදූතවරු ලංකාවේ සංස්කෘතිය ශක්තිමත් කිරීමට හා වර්ධනය කිරීමට උනන්දු වූහ. සංස්කෘතියෙන් විශ්වාසයත් විශ්වාසයෙන් සංස්කෘතියත් මනාව සංවර්ධනය විය.

**දෙවියන් වහන්සේ අපේ ශ්‍රී ලාංකීය සංස්කෘතිය තුළ මාංශගත වී අප සොයාගෙන වඩින සේක. අවදියෙන් සිටින්න.**

**ආසියාව ලෝකයේ ප්‍රධාන ආගම්වල තොටිල්ල වේ.**



**මර්සලින් ජයකොඩි පියතුමා**

**ජුසේවාස් පියතුමා**

..............................................


..............................................

..............................................

- ශ්‍රී ලංකා සහා සංස්කෘතිය දේශානුරූපීකරණය සඳහා උරදුන් පුද්ගලයන් දෙදෙනකුගේ නම් ඉහත දක්වේ. තවත් එවැනි පුද්ගලයන් සොයා ඉතිරි කොටස සම්පූර්ණ කිරීමට ඔබට හැකි ද?
- ක්‍රිස්තුන් වහන්සේ දේශනා කළ වටිනාකම් ශ්‍රී ලංකාවේ අනෙක් සහෝදර ආගම් වලින් ද ප්‍රකාශවේ ද යි මොහොතක් සිතන්න. පහත ලැයිස්තුව සම්පූර්ණ කරන්න.

- ප්‍රේමය
- කරුණාව
- ස්වයං හික්මීම
- බෙදා ගැනීම
- ..........................................
- ..........................................
- ..........................................
- ..........................................

අන්‍ය ආගම්වලට ගරු කරමින් සුහදශීලී ව හැසිරීම ද ක්‍රිස්තියානි වටිනාකමකි. අන්‍ය ආගමිකයන් අතර ජීවත් වන විට කතෝලික විශ්වාසය රැකගැනීම අපගේ වගකීමයි. එය අප හැමෝට ම ඇත. ක්‍රිස්තියානි අනන්‍යතාව රැකගැනීමට අවදියෙන් ක්‍රියා කළ යුතු ය.




**ශ්‍රී ලංකාවේ**
**කිතුනු ඇදහිල්ල පණගැන්වූ පුරෝගාමීන්**

- ජේසු නිකායික පියවරු
- දොමිනිකාන පියවරු
- ෆ්‍රැන්සිස්කාන ධර්මදූතවරු
- අගුස්තීන නිකායික ධර්මදූතවරු
- නිර්මල මරිය නිකායික ධර්මදූතවරු
- ද ලාසාල් සහෝදරතුමන්ලා

**ඉහත සඳහන් කණ්ඩායම්වල පුද්ගලයින්ගේ ආදර්ශ අනුගමනය කරමින් ශ්‍රී ලාංකීය සංස්කෘතිය තුළින් ද දේශීය කණ්ඩායම් බිහිවුණි. ඔවුන් නම්**

- ✡ සුරදූත නිකායික කන්‍යා සොයුරියෝ
- ✡ රොසේරියන් පියතුමන්ලා හා කන්‍යා සොයුරියෝ
- ✡ ගිහි අපෝස්තලික කණ්ඩායම්

**මේ අය අපේ ඇදහිල්ල ජීවමාන බවට සාක්ෂි කරුවෝ ය.**

**සිතා බලන්න**

❒ **ඔබගේ ජීවිතය භාග්‍යවන්ත ද?**

● **මෙම ප්‍රශ්නවලට පිළිතුරු සෙවිය හැකි ද?**

1. දෙමාපියන්ට ගරු කිරීම, ආගන්තුක සත්කාරය යනු අපේ සංස්කෘතියට ආවේණික සාරධර්ම දෙකකි. එවැනි සාරධර්ම ලැයිස්තුවක් පිළියෙල කරන්න.

2. ලාංකීය ක්‍රිස්තියානි සභාව දේශානුරූපී වීම සඳහා ගෙන ඇති පියවරවල් හතරක් ලියන්න.